**බලංගොඩ අධ්‍යාපන කලාපය**

**නර්තනය**

**9 ශ්‍රේණිය (දෙවන වාරය)**

# කඩතුරා කවි

උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන්ට පොදු ගායනා විශේෂයකි. මෙම ගායනාවන් බෞද්ධාගමික මුහුණුවරක් ගන්නා අතර විවිධ වූ නාදමාලා අනුව කවි ගායනය කෙරේ. ශාන්තිකර්මවල දී සුදු පිරුවටයක් ලෙස රංග සැරසිල්ල ආවරණයට භාවිත කරන තාවකාලික ආවරණය කඩතුරාව ලෙස හැඳින්වේ.

ග්‍රාමීය ජන සමාජයේ අවශ්‍යතා පූර්ණ කිරීමටත්, සෙත් ශාන්තිය අපේක්ෂාවෙන් ගෘහස්ථ හා පොදු ශාන්තිකර්මවලටද, සමාජ විශ්වාස හා බැඳුණු මානව ආකල්ප මත ද මේවාට ප්‍රමුඛ බවක් ලබා දෙයි. සිංහල සංස්කෘතිය හා බැඳුණු සාරධර්ම, චාරිත්‍ර විධි ඇතුලත් අවස්ථාවල දී මේවා භාවිත වී ඇත.

මාත්‍රා 3 තාලය

සිහින් සිනිඳු සළුව පැලඳ විත් උන්        මරඟන
වහන්ස නුඹ අප අතහැර මන්ද       මහණ වුණ
අහංකාර ඒ මරඟන දැක්කා                බුදුගුණ
මිහින්තලා ධාතු බලෙන් කඩතිර           අරිමින

පවන් වේග වැසි වලහක දෙවියෝ       රැස්වුණ
සවන් පුරා සැම දෙවියෝ සිටිති අසා        බණ
එවස් එභාතිය රජු හට රන් දොර          හරිමින
රුවන්වැලිය ධාතු බෙලෙන් කඩතිර      හරිමින

ආලවඩන ගන්ධ කුටියෙ මුණි වැඩසිට       ගෙන
නීල වර්ණ පාත්තරා ධාතුව අර              ගෙන
වේලා බලමින රජගහ නුවරට              වඩමින
සේල චෛත්‍යා බලයෙන කඩතිර         හරිමින

# ගොයම් කවි

ගොයම් කැපීමේ ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම කෘෂිකාර්මික ජන සමාජය තුළ ජීවත් වූ මිනිසා තම වෘත්තිය ලෙස වී ගොවිතැන යොදාගෙන ඇත. මෙම කාර්යයෙහි යෙදෙන ගොවියා තම ශරීරයට දැනෙන වෙහෙස, මහන්සිය, විඩාව, පාළුව මඟහරවා ගැනීම පිණිස ගොයම් කැපීමේ කවි ගායනා කරයි. මෙය ගැමි ජනතාවගේ සහජීවනය ඉස්මතු කරන සාමූහකි ක්‍රියාවලියකි. ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම මෙන් ම ඔවුන් තුළ පවතින විශ්වාස පහත කවිවලින් ගම්‍ය වේ. සරල තාලරූප හා නාදමාලා අනුව ගැමි බස් වහර පිළිබිඹුවන පරිදි මෙම කවි නිර්මාණය වී ඇත.

මාත්‍රා 4 + 4

ආශාවෙන් මයි ගොයමට එන්නේ
ආශාවෙන් වද විද රැක ගන්නේ
ආශාවෙන් සත්මස සපිරෙන්නේ
සෝෂාවෙන් මයි ගොයමෙ සිටින්නේ

රන් දැකැති ගෙන නිති සැරසෙනවා
රත්රන් පටි ඉණවට දිලිසෙනවා
රිවි දුටු පිනි බිඳු ලෙස පහවෙනවා
දුම්බර කෙතෙ අපි ගොයම් කපනවා

එපා කියන තැන තැන නොසිටිල්ලා
පිපාස නම් දියවර බීපල්ලා
අපාසු නම් සෙවණේ සිටපල්ලා
කපා ගොයම් කඩිනම් කරපල්ලා

ඉරු දෙවියන්ගේ ඉරගල ගාවා
සඳ දෙවියන්ගේ සඳගල ගාවා
ගණ දෙවියන්ගේ කෝවිල ගාවා
අපිත් කියමු කවි ගොවිපළ ගාවා

# පන් නෙළීමේ කවි

පන් කර්මාන්තයට අදාළ ව පන් නෙළීමේ කවි නිර්මාණය වී ඇත. ගැමි ජනයා තුළ පවතින සාමූහිකත්වය, එකමුතුබව හා සුහදතාව මෙම කවි ගායනා මඟින් විද්‍යමාන වේ. ඇතැම් ශාන්තිකර්මවල පන්නෙළීමේ කවි ගායනා අන්තර්ගත වී ඇති අතර ඒවා සරල තාලයකින් ද නාදමාලාවලින් ද යුක්ත වේ.

මාත්‍රා 3 තාලය

අකණ්ඩියේ අපි යමු පන් නෙළන්නට
ඔක්කොම ගියා රන් මිණිවන් පන් විලට
ගොසින් පන් කපා එන්නේ හවස් කොට
කවුද නගේ දරුවට කිරි පොවන්නට

ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මුහුණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිනිවන් පන් තිබෙන කොට
නෑනෙ නුඹත් එනව ද පන් නෙළන්නට

අහුරු අල්ලමින් අග මුල කපාගෙන
දෙපේලියේ පන් බැඳලා තබාගෙන
සිවු මුල්ලෙන් එක මුල්ලක් පුරාගෙන
පැදුරක් වියමි මේ මුලු තුන් ලොවවටින

මාත්‍රා 2 + 4

ඉරසඳ පාන විල කොතැන ද තුන්හිරියා
ඉරසඳ පාන විල මෙතැනයි තුන්හිරියා
පන් කම් කරන අඟනෝ කාටත් සරියා
මට පැදුරකට පන් දෙනව ද තුන්හිරියා

සැකසුම ඃ සිතාරා පවිත්‍රානි

ර/විද්‍යාකර මහා විද්‍යාලය